# එරාවූර් පත්තුව ප්‍රාදේශිය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 02 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් පත්තුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

--------------------------------------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිනුම්කරණ අඩුපාඩු

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 22,000 ක්වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.3 ලැබිය යුතු ගණුම්

--------------------

1990 – 2002 කාලපරිච්ඡේදය තුල සේවය අත්හැර ගිය සේවකයන් හත් දෙනෙකුගෙන් අයවියයුතු රු. 463,466 ක මුදල මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු නොකර අයවියයුතු මුදලක් වශයෙන් ලේඛනවල දක්වා තිබුණි.

1.3.4 විගණන සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම<br>රු | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 168,002,285 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,625,491 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබඳ විවස්තාරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන සහ කරත්ත | 15,150 | |
| ලී බඩු සහ සවිකිරීම් | 3,087,250 | |
| පුස්තකාල පොත් | 3926793 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකුල නොවීම

-------------------------------------------------------

පහන සඳහන් අනුකුල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 (1) වගන්තිය | ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන නිශ්චල වත්කම් හඳුනාගෙන එම වත්කම්වල වාර්ෂික වටිනාකම් තක්සේරු කර වරිපනම් බදු අය කර ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ආ) ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති - 1988 | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකුලව භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරින් වෙතද එක් එක් කාර්තු අවසානයෙදී ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයට අදාල තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනයකර විචලනය සඳහා පැහැදිලි කිරීම් ඇතුලත් වාර්තාවක් පිළියෙලකර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.14,212,706 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.2,312,781 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 11,899,925 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,025,000 | 2,550 | 1,999,950 |
| බලපත්‍ර ගාස්තු | 1,220,000 | 1,147,120 | 72,880 |
| වරෙන්තු ගාස්තු | 10,005,000 | 8,916,670 | 1,088,330 |
| රාජ්‍ය බදු ආදායම් | 21,600,000 | 11,787,783 | 9,812,217 |

2.2.2 වරිපනම් හා බදු

------------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්ෂික වටිනාකම තක්සේරු කරවා ගැනීම සඳහා කටයුතු නොකිරීම නිසා දල වශයෙන් රු. 1,000,000 ක වාර්ෂික ආදායමක් අහිමිවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 හදුනාගත් පාඩු

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයෙදී සභාවෙන් ලබා දී තිබූ වීපී රේබා සහතික 13 ක ආදායම් රු. 16,000 ක් සභාවේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) මහජන පොළ භූමියතුල බොරලු පස් පිරවීම සඳහා මිල ගණන් කැදවීමේදී මීටර් කියුබ් එකක් රු. 589 වශයෙන් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේවූවද ගෙවීම් කිරීමේදී මීටර් කියුබ් එකක රු. 950 වශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ලෝඩ් 38 ක් සඳහා රු. 13,718 වැඩිපුර ගෙවා තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

උරුගමුවේදී රු. මිලියන 5 ක් වියදමින් ප්‍රතිලාභින් 2157 ක් සඳහා නිශ්චිත දිස්ත්‍රික් සංවර්ධන ආධාර යටතේ පානීය ජලය ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේවූවද ජල ටැංකිය බැඳීම සඳහා රු. 700,000 ක් ඇස්තමේන්තුකර තිබු නමුත් රු. 1,542,175 ක් ගෙවීම් කර තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියේ සඳහන් කර ඇති නමුත් සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-----------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 40 % සිට 60 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය